## 20. ශීර්ෂ 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

### 20.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| විගණන විමසුම් ලේඛනය | මුදල් රෙගුලාසි 452 (1) |
| වාහන ලැයිස්තු ගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

### 20.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුමකට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුමකට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.

### 20.3 විසර්ජන ගිණුම

#### 20.3.1 අයවැය විචලනය

වැය විෂයයන් 04 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 20.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

#### 20.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

#### 20.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**20.4.3 විගණන හා කළමනාකරණ කමිටුව**

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**20.5 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| මුදල් රෙගුලාසි 1646 | - | වාර්තාව ඉදිරිපත් කරනු ලබන මාසයට පසු ඊළඟ මාසයේ 15 දින ගතවන්නට ප්‍රථමයෙන් දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| (i) 2009 ජුනි 17 දිනැති අංක 09/2009(i) දරන චක්‍රලේඛයේ 02 ඡේදය | - | කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණු අතර කාර්ය මණ්ඩලය විසින් කාර්යාල වේලාවෙන් පසු රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් දීමනා ගෙවා තිබුණි. |
| (ii) 2014 ජුනි 16 දිනැති අංක 16/2014 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | - | පෞද්ගලික පාවිච්චිය සඳහා හිමිකම් නොමැති නිලධාරියකු විසින් තනතුරට හිමි නිලරථය සති අන්තයේ පෞද්ගලික ගමන් සඳහා යොදා ගෙන තිබුණි. |
| (iii) 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන චක්‍රලේඛය | - | නිල වාහන පහසුකම් හිමි නොවන සහකාර ලේකම් තනතුර දරන නිලධාරීන් දෙදෙනෙකු විසින් පෞද්ගලික ගමන් සඳහා කාර්යාලයේ සංචිත වාහන අවිධිමත් ලෙස භාවිතා කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ<br>------------------------<br>2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 1 වන ඡේදය | 428,355 | නිලධාරියකු විසින් රාජකාරි ගමන් වෙනුවෙන් විදේශ ගත වීමේ යානා පත්‍ර ශ්‍රී ලංකා එයාර්ලයින් සමාගම හෝ මිහින් ලංකා පුද්ගලික සමාගම වෙතින් මිලදී ගෙන නොතිබුණි. |
| (ඇ) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ<br>--------------------------------------------<br>2010 ඔක්තෝබර් 11 දිනැති අංක 01/2010/01 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | 56,868 | විදේශ අධ්‍යයන චාරිකාවක් සඳහා අනියම් හා සංයුක්ත දීමනා වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඉ) ජනාධිපති ලේකම්ගේ ලිපි<br>----------------------------<br>2012 ජුනි 11 දිනැති අංක සීඑස්ජ්/1/1/16 දරන ලිපියේ 06 වන ඡේදය | 1,146,307 | විදේශ අධ්‍යයන චාරිකාව නිම කර දිවයිනට පැමිණ සති 02 ක් ඇතුලත ශ්‍රී ලංකා රජයට ලැබෙන ප්‍රතිලාභ ඇතුලත් වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |

## 20.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

----------------------------------

කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කාර්යාලයේ වාහනයක් වෙනත් කාර්යාලක කටයුතු සඳහා යොදවා තිබුණි.

(ආ) එකම ස්වරූපයේ කාර්යයක් ඉටු කිරීම සඳහා 2014 ජනවාරි 01 දින සිට 2014 ජුනි 20 දින දක්වා කාල පරිච්ඡේදය තුළ ඉන්ධන ලීටර 1337 ක් හා 2014 ජුනි 21 දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය සඳහා ඉන්ධන ලීටර 615 ක් භාවිතා කර තිබුණි. ඒ අනුව පළමු කාල පරිච්ඡේදයේදී වැඩිපුර ඉන්ධන ලීටර 722 ක් එම කාර්ය ඉටු කිරිම සඳහා භාවිතා කර තිබුණි.

## 20.7 අනාර්ථික ගනුදෙනු

---------------------

නිලධාරියෙකු විශ්‍රාම යාමට දින 04 ක් තිබියදී රු.1,406,307 ක් වැය කර විදේශ අධ්‍යයන චාරිකාවකට සහභාගි කර තිබුණි.

## 20.8 විසඳා නොතිබුණු විගණන ඡේද

කාර්යාලයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් කාර්යාලය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2013 | 1.4.1 | අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. |
| | 1.4.2 | විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි. |
| | 1.6 (i) | රාජ්‍ය පරිපාලන අනුමැතියට පටහැනිව කාර්යාලයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධාරීන්ට රු. 6,000 බැගින් නිල ඇඳුම් දීමනා ලබා දී තිබුණි. |
| | 1.6. (ii) | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව නිල ඇඳුම් දීමනා හිමි නිලධාරීන්ට රු.2,000 බැගින් වැඩිපුර ගෙවීම් කර තිබුණි.<br><br>කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකු පැමිණීම සහ පිටවීම සටහන් නොකිරීම හා රැස්වීම් පැවැත්වෙන දිනයන්හිදී දිනකට රු.750 බැගින් දීමනා ලබා ගෙන තිබුණි.<br><br>ආයතනයේ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. |
| | 1.7 | නිල වාහන හිමි නිලධාරීන් සඳහාද රැස්වීම් පැවැත්වෙන දිනවලදී ප්‍රවාහන දුෂ්කරතා මත ගෙවන රු.750 ක දීමනාව ගෙවා තිබුණි. |
| | 1.8 | වාර්ෂික වැටුප් වර්ධකයට අමතරව අවස්ථා 04 කදී වැටුප් වර්ධක 10 ක් ලබා දී තිබුණි. |

## 20.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 03 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 06 | 06 | - |
| (iii) | ද්විතියික මට්ටම | 15 | 10 | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - |
| | **එකතුව** | **42** | **36** | **06** |